# ඇත් පරපුර රැකගනිමු

අනුර සමරවීර

**අලි ඇතුන් දැනට ගොඩබිම ජීවත්වන විශාලම සත්වයන් ලෙස නම් දරා සිටී. එලෙෆාස් මැක්සිමස් මැක්සිසේ යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන මොවුන් ප්‍රධාන වශයෙන් අප්‍රිකානු හා ආසියානු ලෙස ද දෙකොටසකට බෙදූ දැක්වේ.**

ඉන්දියාව, ශ්‍රී ලංකාව වැනි රටවල වනාන්තර වල ජීවත්වන ආසියානු අලි ඇතුන්ගේ අතීතය ගැන සොයා බැලීමේදී 'එලෙෆාස් මැක්සිමස් මැක්සිමස් සිංහලෙයූස් ' යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වනු ලබන අලියකු මෙරට ජීවත්ව ඇති බවට තොරතුරු ඉතිහාසයේ සඳහන් වේ.

කෙසේ වෙතත් අලින් පිළිබඳව අතීත කතාව අයිස් යුගය ලෙස හඳුන්වන පොළොව අයිස් වලින් වැසී ගිය කාලය දක්වා ඈතට දිව යයි. ඩයිනෝසරයන් මිහිතලයෙන් වඳ වී යාමෙන් පසු ක්ෂීරපායී සතුන් ජනිත වීම ආරම්භ වූ මේ කාලයේ දී මිහිමත සිටි විශාලම සත්වයා ලෙස හඳුන්වන්නේ "එලිෆන්ට් ප්‍රයිමිජිකස්" යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන "වූලි මැමත්" නම් සත්ව විශේෂය යි. මීට වසර 2,00,000 කට පෙර ලෝකය අයිස් වලින් වැසී පැවතිණි. එසේම ගස් කොළන් වැවීම ආරම්භ වූ මේ යුගයේ "වූලි මැමත්" ජීවත් වූයේ ගස්වැල්වල කොළ වර්ග ආහාරයට ගනිමිනි. අයිස් තට්ටු හාරමින් ආහාර සොයා ගැනීමට වෙහෙසුණු මැමත් ඒ සඳහා තම ශක්තිමත් දිගු දළ යුගලය ප්‍රයෝජනයට ගෙන තිබේ. එකල අද මෙන් ලෝකය මහාද්වීප පහකට බෙදී නොතිබුණු බැවින් වර්තමාන ආසියාව යුරෝපය හා ඇමරිකාවේ ප්‍රදේශවල මොවුන් ජීවත්ව ඇති බවට තොරතුරු හමු වී ඇත. ඒ කාලයේ මිහිමත පැවති තද ශීතලින් ආරක්ෂා වීම සඳහා ඇඟ පුරා ලොම් වලින් වැසී තිබූ මේ සත්වයාගේ පෙනුම බොහෝ දුරට ඇතුන්ට ආසන්න විය. "වූලි මැමත්" පිළිබඳව නොයෙකුත් අදහස් ඉදිරිපත් වුවද දැනට ජීවත්වන අලි ඇතුන්ගේ ආදිතමයා ලෙස "වූලි මැමත්" සැලකෙයි. මීට වසර 10,000 කට පමණ පෙර මැමත් සත්වයා මෙලොවින් ඇත් වී ගිය ද අයිස් අතරේ නොනැසී ආරක්ෂා වී පැවති මැමත් සිරුරු අනුව ඔවුන්ගේ හැඩරුව හඳුනා ගැනීමට පහසුවීම ඊට සාක්ෂි දරයි.

දැනට ලෝකයේ ජීවත්වන අප්‍රිකානු හා ආසියානු අලි ඇතුන් සංසන්දනය කිරීමේදී අප්‍රිකානු ඇතුන් ශරීර විශාලත්වයෙන් ඉදිරියෙන් සිටී. ආසියානු අලි ඇතුන් වැඩි වශයෙන් දකුණු ආසියානු ප්‍රදේශවල ජීවත් වේ. අපගේ වන සම්පතෙහි ප්‍රධාන හිමිකරුවකු බවට පත්ව සිටින ශ්‍රී ලංකාවේ අලි ඇතුන් අපේ ජාතික උරුමයේ සංකේතයක් ලෙස ද පිළි ගැනේ. එසේ ම ඈත අතීතයේ සිට ම මෙරට විසූ ජනතාව අලි ඇතුන් අල්ලා හීලෑකර ගැනීමටත්, ඔවුන් ලවා වැඩ කරවීමටත් කටයුතු කර තිබේ.

ක්‍රි.පූ.5 වන සියවස තරම් ඈත අතීතයේදී අලි ඇතුන් අල්ලා විදේශයනට යවා ඇති බවට යම් යම් සාධක හමු වේ. යටත් විජිත යුගයේදී ද අලි ඇතුන් පිටරට පටවා මුදල් ඉපයීමටත් ඇත් දළ ජාවාරමත් සරුවට සිදු විය. අලි ඇල්ලීම උදෙසා අලි කොටු කර තැබිය හැකි "ඇත්ගාල්" වැනි ක්‍රම ක්‍රියාත්මක විය. සීමා රහිත මෙම ක්‍රියාවන් හේතුවෙන් සහ වන විනාශය සංවර්ධනය වැනි හේතු නිසාවෙන් මේ වන විට අපේ අලි පරපුර වියළි කලාපිය වනාන්තර වෙත තල්ලු වී ගොස් තිබේ.

දිනකට ආහාර වශයෙන් කොළ අතු කිලෝ ග්‍රෑම් 250 - 300 ප්‍රමාණයක් ආහාරයට ගන්නා මෙම සත්වයාට පානය කිරීම සඳහා මෙන් ම ස්නානය කිරීම සඳහා ද ජලය විශාල ප්‍රමාණයක් අවශ්‍ය වේ. එබැවින් වනාන්තර ආරක්ෂා වී පැවතීම ඉතා අවශ්‍ය වේ. දැනට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන අභය භූමි ප්‍රමාණය මේ සඳහා ප්‍රමාණවත් නොවන තත්වයකට පත්වීම මගින් මොවුන්ගේ අනාගතයට තව දුරටත් අනාරක්ෂිත තත්වයට පත් කරයි. 20 වන සියවස ආරම්භයේදී 10,000 ක් පමණ වූ අපේ අලි ඇතුන් සංඛ්‍යාව සියවස අවසාන වන විට 2,500 දක්වා අඩු වීම ඊට හොඳම සාක්ෂිය වේ.

අලි තුළ සහජයෙන්ම ඇති සංක්‍රමණික ලැදියාව හේතුවෙන් ජනාවාස ප්‍රදේශ වලට ඇදී එන අලින් හා මිනිසුන් අතර ඇතිවන ගැටුම ද මෙම තත්වයට හේතු වී තිබේ. ඇතින්නක මෙන් ම හෙනෙරක ද තම ජීවිත කාලය තුළ බිහි කරනු ලබන්නේ පැටවුන් පස්දෙනෙකු හෝ ඊට අඩු සංඛ්‍යාවක් බැවින් අලි ඇතුන් සංවරණය කිරීම යුගයේ අවශ්‍යතාවයක්ව පවතී.

කෙසේ වුවද අභය භූමි වලට අමතරව අලින් සඳහා විශේෂිත වූ වස්ගමුව වනෝද්‍යානයට මෙන් ම උඩවලව ඇත් අතුරු සෙවන හා පින්නවල අලි අනාථාගාරය තුළින් ද අපගේ අලි ඇතුන්ගේ පැවැත්ම සඳහා යම් දයකත්වයක් හිමිවන බවද සඳහන් කළ යුතු ය.

අලි ඇතුන් වෙනුවෙන් ලොවේ රට්වල් රැසකින් මුද්දර රැසක් නිකුත් කර තිබේ. ඒ අතර අප්‍රිකානු රටවල් කිහිපයකින් නිකුත් කර ඇති අප්‍රිකානු අලි ඇතුන් පිළිබිඹු කරන මුද්දර රැසකි.

අපේ රටින් ද අපේ අලි පරපුර පිළිබිඹු කරන මුද්දර රැසක් නිකුත් කර තිබේ. ඒ අතරින් විශේෂ ස්ථානයක් ගන්නේ "ලෝක වනජීවී අරමුදල" හා එක්ව 1986 දී නිකුත් කළ "ශ්‍රී ලංකාවේ අලි ඇතුන්" නමැති මුද්දර හතරකින් යුත් මුද්දර පෙළ යි. එය ජාත්‍යන්තර වශයෙන් අවධානයට ලක් වූ මුද්දර කාණ්ඩයක් ලෙස පිළිගැනේ. ඊට අමතරව 1998 වසරේදී ද "ශ්‍රී ලංකාවේ අලි ඇතුන්" පිළිබිඹු කරන මුද්දර හතරක් නිකුත් විය. එසේ ම අලි ඇතුන් විදහා දක්වන වෙනත් මුද්දර කිහිපයක් ද නිකුත් කර තිබේ. මේ අතරින් විශේෂ ස්ථානයක් ගන්නේ දළදා පෙරහැරෙහි කරඬුව වැඩම වූ ඇත්රාජයා වන "රාජා" වෙනුවෙන් නිකුත් කළ මුද්දරය යි. ඊට අමතරව සංචාරක ව්‍යාපාරය දළදා පෙරහැර ආදී අලි ඇතුන්ගේ නියෝජනය පවතින ස්ථාන සලකුණු කරන මුද්දර කිහිපයක් ද අප රටින් නිකුත් කර තිබේ. "මිහි මඬලේ අසරණ වූ දුවැත්තයන්" යන තේමාව යටතේ විවිධ හේතූන් මත අසරණභාවයට පත්වූ අලි ඇතුන් පිළිබඳ නව මුද්දර හතරක් ළඟදීම මුද්දර ලෝකයට තිළිණ කිරීම ද ශ්‍රී ලංකාවේ අලි ඇත් පරපුර වෙත පිදෙන දයාදයක් ලෙස හැඳින්වීමට පුළුවන.

❑